ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

කාන්තා රන් ගිණුම් ඉතුරුම් සහතිකය

නිමැවුමේ ස්වභාවය	ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ	ආරම්භක තැන්පතු හා ගාස්තු	සුදුසුකම්	ප්‍රධාන නියම හා කොන්දේසි
කාන්තාවන් සඳහාම වෙන්වූ ඉතුරුම් සහතිකය	• **පොලී අනුපාතය** නවතම පොලී අනුපාත බලාගැනීමට https://www.boc.lk/ratestariff#rupee-deposit-rates වෙත පිවිසෙන්න. • **කල්පිරීමේ කාල සීමාව**: මාස 15 • එක් ගනුදෙනුකරුවකුට සහතිකපත් කීපයක් සඳහා ඉල්ලුම් කළ හැකිය.	• **ආරම්භක තැන්පතුව** – තැන්පතු වටිනාකම් සඳහා https://www.boc.lk/personal-banking/termdeposits/special-deposits/kantha-ran-ginumsavings-certificates වෙත පිවිසෙන්න. • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** – ගාස්තු දැනගැනීමට https://www.boc.lk/ratestariff#general-tariff වෙත පිවිසෙන්න. • **බදු** - පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	• වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකවේ නේවාසික කාන්තාවන් • රැකියා වීසා බලපත්‍රයක් ඇති ශ්‍රී ලංකාවේ අනේවාසික කාන්තාවන් (විගාමිකයන් හැර) • තනි පුද්ගල ගිණුම් පමණක් විවෘත කළහැකිය. බද්ධ ගිණුම්වලට අවසර නොලැබේ. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, • බැංකුවේ කාන්තා රන් ගිණුම් ඉතුරුම් සහතිකය විවෘතකිරීමේ විශේෂ අයදුම්පත් පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	- මෙම සහතික අලුත්කළ නොහැකි අතර වෙනත් කෙනෙකුට පැවරීම ද කළ නොහැක. - තැන්පතුවට මුදල් සපයාගෙන ඇත්නේ ඉතුරුම්/ ජංගම ගිණුමකින් නම්, කල්පිරීමේදී තිබෙන මුළු මුදල, එම ගිණුම් හිමියාටම අයත් මුදල් සපයන ගිණුම (කාන්තා රන් ගිණුම හෝ වෙනත් ඉතුරුම්/ ජංගම ගිණුම) වෙත මාරු කළ යුතුය. එම ඉතුරුම්/ ජංගම ගිණුම අයදුම්කරුගේ නමින් තනි අයිතියක් යටතේ තිබිය යුතුය. - කල්පිරීමට පෙරාතුව මුදල් ආපසුගැනීමකදී/ ගිණුම වසාදැමීමේදී, බදු මුදලට අනුව ගළපන ලද දැනට පවතින සාමාන්‍ය ඉතුරුම් පොලී අනුපාතයට වඩා 1%ක් අඩුවෙන් ගණනය කරන ලද පොලිය ඇතුළු තැන්පතු වටිනාකම, ගනුදෙනුකරුට ගෙවිය යුතුය. - **BOC කාන්තා රන් ගිණුම් ඉතුරුම් සහතික ඇපයට තබා ණය ලබාගැනීමට අවසර නොලැබේ.** - නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා ප්‍රමුඛතාව පදනම් කොටගෙන සලකා බලනු ලැබේ.
- **දුරකතන:** +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk
- **තැපෑල:** ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු , 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.
අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.